ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## රයිසිනා සංවාදය 2026

ජාත්‍යන්තර ප්‍රජාව මුහුණ දෙන අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීම සඳහා කැප වී කටයුතු කරන භූ දේශපාලනය සහ භූ ආර්ථිකය සම්බන්ධයෙන් ඉන්දියාවේ ප්‍රමුඛතම සමුළුව රයිසිනා සංවාදයයි.

2. 11 වන රයිසිනා සංවාදය 2026 මාර්තු 5-7 දක්වා පැවැත්වේ.

3. අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා මාර්තු 5 වන දින සංවාදය සමාරම්භ කරනු ඇති අතර ෆින්ලන්තයේ ජනාධිපති අතිගරු ආචාර්ය ඇලෙක්සැන්ඩර් ස්ටබ් මැතිතුමා සමාරම්භක උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී වනු ඇත. ෆින්ලන්ත ජනාධිපතිතුමා විසින් සමාරම්භක උත්සවයේ ප්‍රධාන දේශනය ද සිදු කරනු ඇත.

4. රටවල් 110ක අමාත්‍යවරුන්, හිටපු රාජ්‍ය නායකයන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, හමුදාපතිවරුන්, විවිධ කර්මාන්ත නායකයන්, තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන්, අධ්‍යාපනඥයන්, මාධ්‍යවේදීන්, මූලෝපායික කටයුතු සම්බන්ධ විද්වතුන්, ප්‍රමුඛ පෙළේ බුද්ධි මණ්ඩලවල ප්‍රවීණයන් සහ තරුණ තරුණියන් ඇතුළු නියෝජිතයන් රැසක් 11 වන රයිසිනා සංවාදය සඳහා සහභාගී වනු ඇත. ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය ගරු විජිත හේරත් මැතිතුමා ද රයිසිනා සංවාදය සඳහා සහභාගී වනු ඇත.

5. 2026 වසරේ රයිසිනා සංවාදයේ තේමාව වන්නේ “සම්ස්කාරා - අවධාරණය, සහයෝගය, ප්‍රගතිය” යන්නයි. තෙදිනක් පුරා පැවැත්වෙන මෙම සංවාදය අතරතුර දී තීරණ ගන්නන් සහ ලෝකයේ විද්වතුන් සහ

ක්ෂේත්‍ර ප්‍රමුඛයන් වැනි නායකයන් තේමාත්මක කුළුණු හයක් යටතේ විවිධ ආකෘතීන් ඔස්සේ එකිනෙකා සමඟ සංවාදයන් හි නිරත වනු ඇත. එම තේමා හය වන්නේ, (i) තරඟ වදින දේශසීමා: බලය, ධ්‍රැවීයතාවය සහ මායිම් (ii) පොදු සම්පත් ආරක්ෂා කිරීම: නව කණ්ඩායම්, නව භාරකරුවන්, නව මාර්ග (iii) White Whale: එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රයත්න (iv) The Eleventh Hour: දේශගුණය, ගැටුම සහ ප්‍රමාදයේ පිරිවැය (v) Tomorrowland: අනාගත ලෝකයේ තාක්ෂණය (vi) තීරු බදු හමුවේ වෙළෙඳාම: යථා තත්ත්වයට පත්වීම, ඔරොත්තු දීමේ හැකියාව සහ නව මාර්ග සොයා ගැනීම යනාදියයි.

6. රටවල් 110ක නියෝජිතයන් 2700ක් පමණ සංවාදය සඳහා සහභාගී වනු ඇති අතර එය විවිධ ඩිජිටල් වේදිකාවන් ඔස්සේ ලොව පුරා මිලියන ගණනක ජනතාව විසින් නරඹනු ඇත.

7. වැඩිදුර විස්තර https://raisinadialogue.org/raisina-2026 තුළින් ලබා ගත හැකිය.

**කොළඹ**

***2026** මාර්තු **05***

මූලාශ්‍රය:
https://www.mea.gov.in/press-releases.htm?dtl/40851/Raisina+Dialogue+2026